**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

සතිය - 04

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර කලාව

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්‍ෂණ නිර්මාණකරනයේදී භාවිතයට ගනී.

**නිපුණතා මට්ටම :-** 7.1 විවිධ ආගමික බලපෑම් ඇසුරෙන් සම්භාව්‍ය වූ කලා අංග අධ්‍යයනය කරයි.

**පාඩම :- " ක්‍රිස්තියානි දේවස්ථානයක නිර්මාණ ලක්‍ෂණ හඳුනා ගනිමු. "**

- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රිස්තු දහම ව්‍යාප්ත වූයේ 16 වන සියවසේදීය. ක්‍රිස්තියානි දේවස්ථාන ඉදි කිරීම සඳහා පෘතුගීසීන් මුල් විය.
- ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන රෝමානු හා ගොතික් යන නිර්මාණ ශෛලී දෙක අනුව නිර්මාණය කර ඇත. පහත ඡායාරූප හොඳින් බලා වෙනස වටහා ගන්න.

**රෝමානු ක්‍රමයේ දේවස්ථානය**

- බොකු වහලය හා රවුම් ආරුක්කුවලින් සමන්විත වේ. මෙම දේවස්ථානවල ප්‍රධාන දොරටුවට ඉහළින් අලංකාර වීදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුළුවකි. එය Rose Window ලෙස හැඳින්වේ.






Rose Window

**ගොතික් ක්‍රමයේ දේවස්ථානය**

- තුඩු සහිත ආරුක්කුවලින් හා දෙපසට දළ බෑවුම් ඇති වහලය සහිතව නිර්මාණය කර ඇත. එම දේවස්ථානවල තුඩු සහිත කවුළු රංජිත වීදුරුවලින් අලංකාර කර ඇත. රංජිත වීදුරු නිර්මාණවල ක්‍රිස්තියානි ආගමට අයත් විවිධ අවස්ථා හා චරිත නිරූපණය කර ඇත.






රංජිත වීදුරුවලින් අලංකාර

කරන ලද කවුළු

- දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසියක හැඩයක් ගනී. එහි එක් අංගයක් වන අල්තාරය හෙවත් පූජාසනය අලංකාර වැටක් සහිතව නිම කොට ඇති අතර ඒ පිටුපස බිත්තියේ බොහෝ විට චිත්‍රයෙන්, කැටයමින් හෝ රංජිත වීදුරුවලින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇත. පහත කිතු දේවස්ථානයක බිම් සැලැස්ම බලන්න.



1. අල්තාරය
2. කාමර
3. දිග් ශාලාව
4. ස්තම්භ (කුලුනු)
5. බයිබලය කියවන ස්ථානය
6. පිවිසුම් දොරටුව

**ක්‍රියාකාරකම :-** 01. ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ කිතු දේවස්ථාන 03ක් නම් කරන්න.

……………………………………………………………

……………………………………………………………

……………………………………………………………

02. එම දේවස්ථාන කුමන දේවස්ථාන වර්ගයට අයත්දැයි දක්වන්න.

……………………………………………………………

……………………………………………………………